## දුටු වහාම පියවර ගන්න



# ඩූරියන් වගාව ආරක්ෂා කරගනිමු

ඩූරියන් යනු වර්තමානයේ ඉතාමත් ප්‍රචලිත වෙමින් පවතින වැදගත් පලතුරක් වන අතර එය ආර්ථික වශයෙන්ද ඉතා වාසිදායක බැවින් වගා කිරීමට ගොවි මහතුන් පෙළඹී ඇත. මෙම වගාව ප්‍රචලිත වීමත් සමඟ දැනට මෙතෙක් බහුලව නොතිබු පළිබෝධ හා රෝග වර්තමානයේ දක්නට ලැබේ. මෙම තත්වය අනුව දැනට නිතර ගොවි මහතුන්ගේ ක්ෂේත්‍ර වල භාවිතා වෙමින් පවතින ප්‍රධාන පළිබෝධකයෙක් පිළිබඳ විස්තර දැනුවත් කිරීම වැදගත් වේ.

මෙම පළිබෝධකයා කුරුමිනි විශේෂයක් වන අතර බහුලව පැරණි හා නව වගා වලට බහුලව හානි කරමින් සිටී මෙම පළිබෝධකයාගේ කීට අවස්ථාව ඩූරියන් ශාකයේ පොත්තට දැඩි ලෙස හානි කරයි.



පළිබෝධකයා කඳේ පොත්ත තුල උමං හාරමින් පොත්ත කා දමයි

මෙම කුරුමිණියාගේ විද්‍යාත්මක වර්ගීකරණය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| Class | :- | Insecta |
| Order | :- | Coleoptera |
| Family | :- | Cerembycidae |
| Genus | :- | Batocera |
| Spp | :- | *Batocera rufomaculata* |






බිත්තර කැදලි



වැඩුනු කීටයා



සුහුඹුල් කුරුමිණියා

පරිසර උෂ්ණත්වය සමඟ මෙම කුරුමිණියාගේ වර්ධන වේගය වෙනස් වේ. පරිසර උෂ්ණත්වය වැඩි වීමත් සමඟ වර්ධනය සහ ක්‍රියාකාරීත්වය වැඩි වේ. උෂ්ණත්වය අඩුවන විට කුරුමිණියාගේ ක්‍රියාකාරීත්වය අඩු වේ. දූරියන් හැර අඹ, කොස්, රබර්, කජු, අලිගැටපේර වැනි ශාක ද ධාරක ශාක ලෙස යොදා ගනී.

## හානි කරන ආකාරය

සුහුඹුල් කුරුමිනියා කඳේ පොත්ත මතුපිට කුඩා සිදුරු සහිත ස්ථාන වල හෝ එවැනි ස්ථාන සාදා බිත්තර දැමීම සිදු කරයි. මෙම බිත්තර වලින් දින 7 - 14 අතර කාලයකින් කීටයන් බිහි කරන අතර මෙම කීටයන් දින 200 ක පමණ ඉතා දීර්ඝ කාලයක් දූරියන් ශාකයට හානි කරයි. මෙහිදී පොත්ත තුළ උමං හාරමින් පොත්ත කා දමයි. කීටයා වර්ධනය වන විට දැඩි හානියකට ගස ලක් වේ. ඉන්පසුව කෝෂ ගත වන කීටයා දින 20 - 29 ක් පමණ පිලා අවස්ථාව ගත කොට නැවත සුහුඹුල් සත්වයෙකු බවට පත් වේ. වැඩිහිටි සත්වයා මාස 6 ක් පමණ ජීවත් වේ. මෙම හානිය කුඩා කීට අවස්ථා වලදී හඳුනා ගැනීම තරමක් අපහසුය. නමුත් කීටයා විශාල වීමත් සමඟ ආහාරයට ගන්නා කොටස් සහ කැදලි, ගස මුල වැටී තිබීමෙන් හඳුනා ගත හැකිය. තවද කඳෙන් යුෂ වහනය වීමක්ද සිදුවේ. හැකි ඉක්මනින් මේ සඳහා ප්‍රතිකාර කිරීම අත්‍යවශ්‍ය වේ. නැතහොත් දූරියන් ශාකය මිය යාමටද ඉඩ ඇත. පාලනය කිරීම ඉතා අපහසු අතර හැකි සෑම පියවරක්ම ඒ සඳහා ගත යුතු වේ.

මෙම සත්වයා විවිධ සාමාන්‍ය නම් වලින් හඳුන්වයි. දූරියන් පොත්ත විදින්නා, රතු තිත් සහිත දිගු අං සහිත කුරුමිණියා, අඹ කඳ විදින්නා ලෙසද දැක්විය හැකිය. Long horn stem beetle (*Batocera rufomaculata*) ප්‍රධානව දූරියන් වගා කරන ප්‍රදේශ වල බහුලව දැකිය හැකි ප්‍රධාන පලිබෝධකයෙකි. ඉතා ප්‍රබල

පලිබෝධකයෙකි. පහසුවෙන් මර්ධනය කළ නොහැකිය. පාලනය කිරීම සඳහා කුරුමිණියාගේ හැසිරීම, හැසිරීමේ රටාව, බෝවීම, බිත්තර දැමීමේ රටාව, ජීවන චක්‍රය පිළිබඳව මනා අවබෝධයක් තිබීම වැදගත් වේ.

මෙම වර්ගයේ විශේෂ කිපයක් ඇත. බහුලව සහ ප්‍රධානව හානි කරනුයේ *Batocera rufomaculata* Degeer විශේෂයයි. දැනට ලංකාවේ දූරියන් වගාව ආශ්‍රිතව මෙම හානිය ඇත. බිත්තර වලින් පිටතට එන කීටයා පොත්ත ආහාරයට ගනී. වැඩුනු කීටයා ප්ලෝයම පටක ආහාරයට ගනිමින් වර්ධනය වේ. ඉන් පසුව කුහර සාදමින් කෝෂ ගත වීම සඳහා කඳේ දැඩි කොටසට ගමන් කරයි. කුඩා කීටයා ගේ හානිය හඳුනා ගැනීම අපහසු වේ. නමුත් කඳ සිදුරු කිරීම, යුෂ වහනය වීම, පනු කැදලි දක්නට ලැබීම තුලින් වැඩුණු කීටයා හඳුනාගත හැකිය. හොඳින් වැඩුණු කීටයා සෙන්ටිමීටර් 8 - 10 පමණ දිගැතිය. පෙර කෝෂ අවස්ථාව දින 200 - 280 ක් පමණ වන අතර කෝෂ අවස්ථාව දින 20 - 29 පමණ වේ.

## පාලනය කිරීම

මෙහිදී සුහුඹුල් සතුන් යාන්ත්‍රිකව විනාශ කිරීම, කඳේ උමං ශුද්ධ කර කීටයන් විනාශ කිරීම, ශාකයේ මිය ගිය සහ හානි වූ කොටස් කපා ඉවත් කර පුළුස්සා දැමීම. ගසේ මතුපිට කුරුට්ට කොටස ශුද්ධ කර ප්‍රබල කෘමිනාශක නිතර යෙදීම මගින් බිත්තර දැමීම සහ දමන බිත්තර මගින් පිටවන අළුත් කීටයන් විනාශ කිරීම, සිදු කළ හැකිය. මීට අමතරව අලෝක උගුල් භාවිතා කර පරිනත කුරුමිණියා පාලනය කිරීම, නිතර නිතර ගස් පරීක්ෂාවට ලක් කොට කීටයන් හානි කර ඇත්දැයි බලා ඔවුන් විනාශ කිරීම. කඳ ශුද්ධ කළ සෑම අවස්ථාවකටම කෘමිනාශක වලට අමතරව කැන්ඩසාන් වැනි දිලීර නාශකයන් අලේප කිරීම වැදගත් වේ. වගාව පිළිබඳ නිරන්තර අධීක්ෂණය ඉතාමත් වැදගත් වේ. අඛන්ඩව කෘමිනාශක යෙදීම මෙහිදී අවශ්‍ය වේ.



ගසේ මතුපිට කුරුට්ට කොටස ශුද්ධ කර කෘමිනාශක යෙදීම

**තොරතුරු ගෙන ආවේ,**

**ඩබ්. ඩී. ලෙස්ලි**

**සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - පර්යේෂණ**

**පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය**

**කනන්විල, හොරණ**